# ලෝකාන්තය

තිස් අට වසරකට පෙර මා සරසවියේ
කඳුරට වුවත් වැලිකතරක් සේ ගෙවියේ
අවසන් වසර මුල් භාගය ඇරඹීයේ
විනෝද චාරිකාවෙනි ලෝකාන්තයේ

මහ මග අවසන්ය බස් රිය නතර විය
කුසගිනි නිවන ලෙස තුරු සෙවනකට විය
ආහර පාර්සල් බඳුනත් විවර විය
මා සිටියේ එහි පෝලිම කෙළවරය

මා අත ගියේ හිස් බඳුනට බව දැනුනී
ඒ බව දුටු ඈ මා වෙත නැඹුරු වුනී
ඇගෙ බත් පතට හවුලට ඇරයුම් කෙරුනී
නොකැමැත්තෙන් වුවද එය පිළිගන්ට වුනී

නව අත්දැකීමකි මින් පෙර නොසිදුවුන
දුටුවේ මුල් වරටය මා ඒ අඟන
සිතුවිලි වෙලාගති මා සිත කලඹවන
බත්පත හිස් වන්නට විය රස නොදැන

ආදර නෞකාවෙහි නැංගුරම් දමා
තිබුනලු වසර තුන හතරක් වෙවී පමා
සාමය සතුට සමගින් ඇරඹූ ගමනා
දුශ්කර නමුදු ඉදිරියටම යයි මෙදිනා

නිසල සයුරකට ඒ නැව පිවිසේවා!
මුල් පෙම අවසන් පෙම ලෙස පවතීවා!
දරුවන් සේම මුනුපුරුනුත් බිහි වේවා!
තෙරුවන් බෙලෙන් අප සැමහට සෙත් වේවා!

හිඹුටානේ ජයසිරි විජේරත්නගේ අතීත අත්දැකීමක්!
2003 – 09 - 13